**ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල.**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 3 හි 32 වන පරිච්ඡේදයට පටහැනිව, ලැබිය යුතු නිෂ්පාදන චිත්‍රපට ආදායම් රු. 1,043,265 ක් ගෙවිය යුතු නිෂ්පාදිත චිත්‍රපට වියදම රු. 2,537,597 ට ගලපා ශුද්ධ අගය වූ රු. 1,494,332 මුදලක් ණයහිමියෝ වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

සමාලෝචිත වර්ෂයට අදාල චිත්‍රපට කුලි දායකත්වය වූ රු. 1,876,692 ක මුදලින් ලද චිත්‍රපට කුල දායකත්වය වූ රු. 83,101 ක ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණු නමුත් ලැබිය යුතු ආදායම වූ රු. 1,793,591 ක් ගිණුම් තැබීමේදි, ආදායම් ගිණුම වෙනුවට ණයහිමි ගිණුමක දක්වා තිබුණි.

1.2.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට රු. 73,616,244 ක් වූ චිත්‍රපට නිෂ්පාදන ණය ශේෂයෙන් 99% ක් එනම් රු. 72,923,005 ක් වසර පහකට වඩා වැඩි ශේෂයන් වූ අතර 2011 වර්ෂය තුලදී තරණය චිත්‍රපටය සඳහා වූ ණය මුදලින් ලැබුණු රු. 100,000 ක මුදල හැරුණු විට චිත්‍රපට ප්‍රදර්ශනය නොවීම හේතුවෙන් කිසිදු ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි. එයින් අය කර ගත නොහැකි බවට ඇස්තමේන්තු කර ඇති ණය ප්‍රමාණය රු. 57,714,499 ක් හෙවත් 78% ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී බොල්ණය ලෙස රු. 7,213,526 ක වෙන් කිරීමක් කර තිබුණ අතර එය ඉකුත් වසරට වඩා රු. 5,059,167 ක් හෙවත් 235 % කින් වැඩිවීමකි. තවද, උඩුගංයාමය චිත්‍රපටය සඳහා ලබාදුන් රු. 7,783,032 ක් වූ මුළු ණය මුදල 2011 වර්ෂයේ බොල්ණය ලෙස වෙන්කර තිබුණි.

"චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලබාදී ඇති ණය මුදල් අයකරන ලබන්නේ අදාල චිත්‍රපට ප්‍රදර්ශනයෙන් ලැබෙන ආදායමින් බැවින්ද, මෙම චිත්‍රපටය මෙම වර්ෂයේදී ප්‍රදර්ශණය නොවී ඇති බැවින් මෙම ණය මුදල අය නොවේ යැයි සලකා සම්පූර්ණ ණය මුදලම වෙන්කිරීමක් වශයෙන් පෙන්වා ඇති බව" සභාපති විසින් මා වෙත වාර්තා කරන ලදී.

(ඇ) අරමුදල පවත්වාගෙන යාම සඳහා දේශිය හා විදේශිය චිත්‍රපටවලින් චිත්‍රපට සංස්ථාවට අයවිය යුතු සංස්ථා භාරයෙන් 20% ක් අරමුදලට ලබාදෙන නමුත් 2011 දෙසැම්බර් 31 දිනට අරමුදලට ලැබිය යුතුව පැවැති චිත්‍රපට කුලි දායකත්වය රු. 17,039,059 ක්ව තිබුණි. එයින් රු. 7,933,187 ක් එනම් 47% ක් පමණ අවුරුදු 05 කට වැඩි ශේෂයන් වේ.

(ඈ) අළුත්වැඩියාව හා නවීකරණය සඳහා සිනමාශාලා 5ක් වෙත ලබා දුන් ණය මුදල් හා ඊට අදාල පොලී මුදලින් 2011 ජනවාරි 01 දිනට අයවිය යුතු ශේෂය රු. 14,544,045 ක් වූ අතර එම ණය වෙනුවෙන් 2011 වර්ෂයේදී අරමුදලට ආපසු ගෙවන ලද මුදල රු. 1,231,442 ක් හෙවත් 9% ක් විය. සිනමාශාලා 2 කින් කිසිදු ණය වාරිකයක් අයවී නොතිබුණි.

### 1.2.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1996 ඔක්තෝබර් 24 දිනැති අංක 946/9 දරන චිත්‍රපට සංවර්ධන අරමුදල සම්බන්ධ ගැසට් පත්‍රය | |
| (i) නියෝග අංක 6 (ඇ) | ප්‍රදානය කළ ණය මුදල් ආපසු ගෙවීම පමාද වන්නේ නම් ඒ සඳහා අයවිය යුතු අධිභාරයන් නිශ්චය කර අයකර ගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.<br>"ණය මුදල් අයකර ගනු ලබන්නේ අදාල චිත්‍රපටය ප්‍රදර්ශණයෙන් ලැබෙන ආදායමිනි. ආදායම අඩුවීම |

| | | |
|---|---|---|
| | | මත ණය මුදල් අයකර ගැනිමට නොහැකිවී ඇත. මෙහිදී ණය මුදල් ආපසු අයකර ගැනිම ප්‍රමාද වීම මත අධිභාර ගණනය කර ආදායම හා ණයගැතියන් වශයෙන් පෙන්නුම් කිරමේදි නොලැබෙන ආදායම පොත්වලට ගැනිමට සිදුවේ. කෙසේ වෙතත් ණය අයකර ගැනිමට හැකි වුවහොත් ආදාල අධිභාරයද අය කර ගැනිමට කටයුතු කරන බව" සභාපති විසින් මා වෙත වාර්තා කරන ලදී. |
| (ආ) | මුදල් රෙගුලාසි 168(3) | අවලංගු කරන ලද කුවිතාන්සිවල මුල්පිටපත හා දෙවන පිටපත කුවිතාන්සි පොත සමග තිබිය යුතු වුවද, අවලංගු කරන ලද කුවිතාන්සි සම්බන්ධයෙන් ඊට අනුකුලව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2000 ජුනි 12 දිනැති අංක පීඑෆ් / පීඊ / 09 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2000 වර්ෂයේදී ආයෝජනය කර තිබුණු වටිනාකම රු. 2,000,000 ක් වු ස්ථාවර තැන්පතු සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. එය බැංකු අයිරාවක් සඳහා ඇප සුරකුමක් වශයෙන් ද තබා තිබුණු අතර ඒ පිළිබද තොරතුරු මුල්‍ය ප්‍රකාශනවල සටහන් හි දක්වා නොතිබුණි. |

## 2. මුල්‍ය සමාලොචනය

## 2.1 මුල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 3,628,437 ක බදු පූර්ව ඌනතාවයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ වූ බදු පූර්ව ඌනතාවය රු. 16,488 ක් වයෙන් බදු පූර්ව ඌනතාවයෙහි වැඩිවීම රු. 3,611,949 ක් හෙවත් 21,906% ක් විය. ඌනතාවය වැඩිවීම කෙරෙහි බොල්ණය ප්‍රතිපාදනය වැඩිවීම වු රු. 5,059,167 ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. විස්තර පහත දැක්වේ.

| විස්තරය | සමාලෝචිත වර්ෂය | ඉකුත් වර්ෂය | අඩුවීම/ වැඩිවීම | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| විදේශ චිත්‍රපට රූගතකිරීමේ අනුමත ගාස්තු හා විදේශ කාර්මික ශිල්පීන් සඳහා ලැබීම් | 2,444,725 | 1,122,300 | 1,322,425 | 118 |
| චිත්‍රපට ප්‍රදර්ශනයෙන් ලද ආදායම,චිත්‍රපට කුලී දායකත්වය හා නිෂ්පාදන ණය පොලි | 332,346 | 353,835 | (21,489) | 6 |
| අධිභාරය | - | 4,000 | (4,000) | 100 |
| විවිධ ආදායම් | 1,224,696 | 1,289,449 | (64,753) | 5 |
| බොල්ණය ප්‍රතිපාදන | 7,213,526 | 2,154,359 | (5,059,167) | 235 |
| විගණන ගාස්තු ,බැංකු ගාස්තු, ලිපි ද්‍රව්‍ය , තිර නාටක අනුමැතිය, සංග්‍රහ වියදම් | 62,851 | 34,213 | (28,638) | 84 |
| චිත්‍රපටි නිෂ්පාදිත වියදම් | - | 243,673 | 243,673 | 100 |
| | | | (3,611,949) | |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

1994 අංක 1 දරන ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ නියෝග මාලාවේ අංක 4 දරන නියෝගය යටතේ (අ) සිට (ඕ) දක්වා වූ සංවර්ධන අරමුදලේ කාර්යභාරයන්ගෙන් කිසිවක් 2011 වර්ෂය තුළදී ඉටුකරගෙන නොතිබුණි. තවද, 2011 අයවැය ඇස්තමේන්තුව මගින් රු. 2,030,000 ක මුදල් වෙන්කරන ලද පහත සඳහන් කාර්යයන් හතරින් අඩුම තරමින් එක් කාර්යභාරයකවත් සාක්ෂාත් කරගැනිමට කටයුතු කර නොතිබුණි.

| | | රු. |
|---|---|---|
| (i) | සිනමා උලෙළයන් සඳහා | 500,000 |
| (ii) | පාඨමාලා වියදම් | 500,000 |
| (iii) | ජාතික චිත්‍රපට කර්මාන්තයට අධාර සඳහා | 500,000 |
| (iv) | සංවර්ධන ව්‍යාපෘති | 530,000 |

"අරමුදලේ කාර්‍යයන් නිසියාකාරව ක්‍රියාත්මක නොවූ හෙයින් මෙම කාර්‍යයන් අක්‍රියව පැවතුණු බවත් ඉදිරි වර්ෂයේදී කටයුතු කිරීමට උපදෙස් දෙන ලද බවත් " සභාපති විසින් මා වෙත වාර්තා කරන ලදී.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අරමුදල විසින් නිෂ්පාදනය කර චිත්‍රපට සංස්ථාවට විකුණනු ලැබූ "වැකන්ද වලව්ව" චිත්‍රපටයෙන් 2005 වර්ෂයේ සිට අයවිය යුතුව පැවති රු. 3,547,454 ක මුදලක් චිත්‍රපට සංස්ථාවෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) ගිරිඋල්ල සිනමාශාලාව සඳහා ලබා දී ඇති ණය හා පොලී මුදල වන රු. 2,355,959 න් කිසිදු ණය වාරිකයක් හෝ පොලී මුදලක් ආපසු අය කර ගැනීමට අරමුදල කිසිදු නීතිමය පියවරක් නොගෙන මුළු වටිනාකම අය කර ගත නොහැකි ලෙස ඇස්තමේන්තු කර ණයගැති ශේෂයෙන් අඩුකර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. එකී ණය මුදල අදාල කාර්යන් සඳහා යොදාගෙන නොතිබුණු බවද නිරීක්ෂණය විය.

(ඇ) ජාතික චිත්‍රපට සංස්ථාව විසින් ඉන්දියාවේ පෞද්ගලික රසායනාගාරයක් සමඟ එක්වී 2007 වර්ෂයේදී "සඳ දිය සළු " නැමති චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීමට ස ැලසුම් කර මූලික වියදම් ලෙස රු. 200,000 ක් වැය කර නිෂ්පාදකයකු සොයා ගැනීමට නොහැකි වීම හෙතුවෙන් නිෂ්පාදනය අතහැර දමා එය අරමුදලේ චිත්‍රපට තොගයට ඇතුළත් කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා පාලක මණ්ඩලයක් පත්කර ඇතත්, 2011 වර්ෂය තුල අවස්ථා දෙකකදී පමණක් රැස්වී තිබුණ අතර ප්‍රධාන මෙහෙයුම් තිරණ කිසිවක් ගෙන නොතිබුණි.

3.3 **නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

2008 වසරේ සිට ජංගම ගිණුමක රු. 227,283 ක මුදලක් අක්‍රියව පවතින බව නිරීක්ෂණය විය.

3.4 **කාර්යමණ්ඩල පරිපාලනය**

අවස්ථා දෙකකදී පැවැත්වූ පාලක මණ්ඩල රැස්වීම් තිරණ අනුව අරමුදලේ රාජකාරි කටයුතු වෙනුවෙන් සංස්ථා නිලධාරීන් දහ දෙනෙකු සඳහා මසකට රු. 29,000 බැගින් ගෙවීම අනුමත කර තිබුණ අතර 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාර්ය මණ්ඩල දිමනා වියදම් ලෙස රු. 1,711,000 ක් වෙන්කර තිබුණි. 2011 වර්ෂය තුලදී අරමුදලේ අරමුණු කිසවක් ඉටුකරගෙන නොතිබියදිත් 2011 වර්ෂය සඳහා කාර්ය මණ්ඩල වියදම් ලෙස

රු. 348,000 මුදලක් වෙන්කිරීමෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩිවී තිබුණි. තවද මනා ලෙස කාර්යය පැවරුම් සිදුකර අත්‍යාවශ්‍ය නිලධාරීන් පමණක් මෙම කාර්යය සඳහා යොදවා ගැනීමට අවධානය යොමු කර නොතිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දින හා අංක .පීඊඩී/12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණු අතර ඉදිරි වර්ෂ සඳහා පිළියෙල කිරීමට හෝ අවධානය යොමු කර නොතිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

අරමුදලේ ගිණුම් කටයුතු අභ්‍යන්තර විගණන ඒකකය මගින් විගණනයට ලක්කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිවරයා වෙත වරින්වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) ණය අයකර ගැනීම

(ආ) අධිභාර